චක්‍රලේඛ අංකය: 1/2018

RG/MBD/1/22


දුරකථන / தொலைபேசி இல. / Telephone Nos: 2889488, 2889489

ෆැක්ස් / தொலைநகல் / Fax No.: 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.

234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகத் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgdept.lk


දිනය / திகதி / Date: 2018/03/21

(14)

සියළුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

**විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම - 2018**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF-1/10/BR/27 හා 2018.01.27 දිනැති ලිපියෙන් අනුමත කරන ලද විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ සංශෝධිත පරිපාටිය අනුව සංශෝධනය කරන ලද අත්පොතෙහි හා අදාල ලේඛනවල පිටපත් මේ සමග එවමි. 2018.01.01 දිනට පසු ගැසට් මගින් අයදුම්පත් කැඳවන පුරප්පාඩු සඳහා මෙම සංශෝධිත පරිපාටිය අනුව බඳවා ගැනීමේ කටයුතු සිදු කළ යුතු වේ.

02. මේ යටතේ සංශෝධන සිදුවූ ලේඛන පහත පරිදි වේ.

I. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමේ ක්‍රමය - ඇමුණුම 01

II. විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම "අ" උපලේඛනය.

III. විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ අත්පොත 2018 (18 ඡේදය).

IV. අයදුම් පත්‍රය (ලි.ප. බී.75).

V. අයදුම්පත් කැඳවීමේ දැන්වීම (ලි.ප. බී.74).

03. අදාල සියළුම ලේඛනවල පිටපත් සිංහල හා දෙමළ භාෂාවෙන් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවමි. ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස.
3. කළාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
4. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
5. සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් (ප්‍රා. ලේ. කාර්යාල) - අ.ක.ස.

| දැනට ඇති ප්‍රතිපාදන (2011) | ලකුණු | නව සංශෝධන (2018) | ලකුණු |
|---|---|---|---|
| **(1)** බඳවා ගැනීමේ වයස<br>1.1 අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර අවුරුදු 60ට නොවැඩි විය යුතුය.<br>1.2 විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 විය යුතුය. | | **(1)** බඳවා ගැනීමේ වයස<br>1. 1අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවුරුදු 45ට නොඅඩු විය යුතු අතර අවුරුදු 62ට නොවැඩි විය යුතුය.<br>1. 2විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ. | |
| **(2)ලකුණු දීමේ ක්‍රමය**<br>*අධ්‍යාපන සුදුසුකම්*<br>අ.පො.ස. (සා.පෙ.) භාෂාව විෂයට (තනතුරට අදාළ භාෂා මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින්වත් සමත්ව තිබීම මූලික අධ්‍යාපන සුදුසුකම වේ. මේ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.<br>**අ.පො.ස. (උ.පෙ.) විෂයන් තුනකින් එකවර සමත්වීම හෝ ඊට වඩා වැඩි අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 10**<br>මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය මූලික අධ්‍යාපන සුදුසුකමට වඩා උසස් සුදුසුකමක් වශයෙන් සලකා අ.පො.ස. (උ.පෙ.) වෙනුවට ඉහත ලකුණු ලබා දිය යුතුය<br>**i** ඉහත අධ්‍යාපන සුදුසුකම් සඳහා<br>**ii** අත් අකුරු සඳහා<br>(තනතුරට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් මෙම ලකුණු 20න් ලකුණු 15ක් වත් ලබා තිබිය යුතුය.)<br>**iii** චරිතය/ සමාජ තත්ත්වය/ ජනප්‍රසාදය (සඳහා එක් කොටසකට ලකුණු 05 බැගින්)<br>**iv** ආදායම් තත්ත්වය සඳහා<br>**v** යෝජිත කාර්යාලය පවත්වන ස්ථානය | 10<br>20<br>15<br>15<br>10 | **(2)ලකුණු දීමේ ක්‍රමය**<br>*අධ්‍යාපන සුදුසුකම්*<br>අ.පො.ස. (සා.පෙ.) භාෂාව විෂයට (තනතුරට අදාළ භාෂා මාධ්‍යය) **සම්මාන සාමාර්ථයක්** සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත්ව තිබීම මූලික අධ්‍යාපන සුදුසුකම වේ. (මේ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)<br>**I.** අත් අකුරු සඳහා<br>අක්ෂර වින්‍යාසය හා අත් අකුරු වල නිවැරදි බව, පැහැදිලිව බව හා පහසුවෙන් කියවිය හැකිවීම සඳහා<br>(තනතුරට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් මෙම ලකුණු 25න් ලකුණු 15ක් වත් ලබා තිබිය යුතුය.)<br>**II.** දෙන ලද ඡේදයක් පැහැදිලිව කියවීමේ හැකියාව<br>**III.** චරිතය<br>(අයදුම්කරුවන් යහපත් චරිතයක් ඇති අය විය යුතුය.)<br>**IV.** සමාජ තත්ත්වය/ ජනප්‍රසාදය<br>(සමිති සමාගම් වල තනතුරු දරන්නේ නම් ඒ පිළිබඳ සහතික, හා වෙනත් ප්‍රශංසාත්මක ලිපි) | 25<br>10<br>10<br>10 |

| | | | |
|---|---|---|---|
| **vi** අමතර භාෂා දැනුම<br>(පුරප්පාඩු තනතුරට අදාළ භාෂා මාධ්‍යය නොවන සිංහල/ දෙමළ භාෂාව පිළිබඳව දෙවන භාෂා දැනුම සඳහා ලකුණු ලබා දීම සඳහා අ.පො.ස.(සා.පෙ.) සාමාර්ථය ලබා තිබීම සැලකිය යුතුය.) | 05 | **V.** පෞරුෂය<br>(අයදුම්කරු මනා පෞරුෂයකින් හෙබි අයකු විය යුතුයි. ශාරීරිකව හා මානසිකව ආබාධිත තත්වයේ පසු නොවිය යුතුය. සුහද බව, ප්‍රසන්න බව, ආචාරශීලිව කථා කිරීමේ හැකියාව, පිළිවෙල) | 15 |
| **vii** වැඩ බලන රෙජිස්ට්‍රාර්වරුන් සඳහා<br>වසරකට වැඩි කාලයක් සඳහා 25<br>වසරක කාලයක් සඳහා 20<br>මාස 06ක කාලයක් සඳහා 10 | 25 | **VI.** ආදායම් තත්ත්වය<br>(අයදුම්කරුගේ/ කලත්‍රයාගේ ආදායම් විස්තර හා ආදායම් මාර්ග) | 10 |
| | | **VII.** යෝජිත කාර්යාලය පවත්වන ස්ථානය | 10 |
| | | **VIII.** අමතර භාෂා දැනුම<br>(පුරප්පාඩු තනතුරට අදාළ භාෂා මාධ්‍යය නොවන සිංහල/ දෙමළ භාෂාව පිළිබඳව දෙවන භාෂා දැනුම සඳහා ලකුණු ලබා දීමේදී අ.පො.ස. (සා.පෙ.) සාමාර්ථය ලබා තිබීම සැලකිය යුතුය.) | 10 |
| | **100** | | **100** |

**තනතුරට සුදුසුකම් ලැබීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී අවම වශයෙන් ලකුණු 50 ක් ලබා තිබිය යුතු වේ.**

# විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම

**01. සුදුසුකම් :-**

I. විවාහ / අතිරේක විවාහ (සාමාන්‍ය / උඩරට) රෙජිස්ට්‍රාර් තනතුරු, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සහ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කල හැකිය. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම් කළහැකි වනුයේ මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණි.

II. පෞද්ගලික හෝ රජයේ වැටුප් ලබන ස්ථිර රැකියාවක සිටින අයෙකු ඉල්ලුම් කරන්නේ නම් මෙම තනතුර භාරගන්නා අවස්ථාවේ දී රැකියාවෙන් ඉවත් වී සිටිය යුතුය.

**02. පුරවැසිභාවය :-**

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතුය. ශ්‍රී ලාංකික යනුවෙන් හඳුන්වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීමයි.

**03. පදිංචිය :-**

අයදුම්කරුවන් අදාළ කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

**04. I. වයස :-**

- අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර 62 නොඉක්මවිය යුතුය.

**II. විශ්‍රාම ගැන්වීමේ වයස :-**

(අ). අයදුම්කරුවන් විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 විය යුතු අතර වයස අවුරුදු 60 – 65 දක්වා සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. වයස අවුරුදු 60 – 65 තෙක් සේවය දීර්ඝ කිරීම සිදු නොකරන ඕනෑම අවස්ථාවක රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කෙරේ.

(ආ). රාජකාරි කරන සෑම රෙජිස්ට්‍රාර්වරයෙකුම වයස අවුරුදු 55 දී දිස්ත්‍රික් ලේකම් ඉදිරියේ පෙනී සිටිය යුතුය. දිස්ත්‍රික් ලේකම් විසින් මෙම රෙජිස්ට්‍රාර්වරයා රෙජිස්ට්‍රාර් ධුරයේ රාජකාරි හා වගකීම් මැනවින් ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික (ඇස් පෙනීම, කන් ඇසීම ඇතුළුව) හා මානසික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්න පරීක්ෂා කළ යුතුය. එහිදී අවශ්‍ය යැයි හැඟෙන්නේ නම් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්විය යුතුය.

ඉන්පසු වයස අවුරුදු 60 දක්වා ද අවශ්‍ය විටෙක වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැක.

වයස අවුරුදු 60න් පසු 65 දක්වා මෙතෙක් ක්‍රියාත්මක වූ පරිදි සේවා දීර්ඝ කිරීම් කළ යුතු අතර එම කාලය තුළද අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම විටෙක වෛද්‍ය වාර්තා කැඳවිය හැක.

(ඇ). රැකියාවේ ගරුත්වයට හානි වන හෝ රාජකාරි නිසිපරිදි කරගෙන යාමට අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය නොමැති බව පෙනී යන ඕනෑම අවස්ථාවකදී ඉහත සඳහන් වෛද්‍ය වාර්තා සති 02ක් තුළ දී ඉදිරිපත් කළ යුතු බවට දිස්ත්‍රික් ලේකම් විසින් රෙජිස්ට්‍රාර් වරයා හට විධිමත්ව දැන්විය යුතුය. කෙසේ වුවද වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අමතර කාලයක් අවශ්‍ය බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් සාධාරණ හේතු ඉදිරිපත් කරන අවස්ථාවක දී දිස්ත්‍රික් ලේකම් විසින් ඒ සඳහා සාධාරණ කාලයක් ලබා දිය යුතුය.

(ඈ). රාජකාරි නිසිපරිදි කරගෙන යාමට අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය නොමැති යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක වෛද්‍ය නිර්දේශය මත දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය රෙජිස්ට්‍රාර් ජනරාල් අනුමත කරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විශ්‍රාම ගන්වනු ඇත.

(ඉ) ඉහත පරිදි අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා විධිමත් දැනුම්දීමකින් පසුවත් රෙජිස්ට්‍රාර්වරයා විසින් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් නොකරන ඕනෑම අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය රෙජිස්ට්‍රාර් ජනරාල් අනුමත කරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විශ්‍රාම ගන්වනු ඇත.

(ඊ) ඉහත (ආ) හා (ඉ) වගන්ති වලට අමතරව රෙජිස්ට්‍රාර්වරයෙකු තම ධූරයේ රාජකාරි හා වගකීම් ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන ශාරීරික හා මානසික අයෝග්‍යතාවයකින් පෙලන්නේ නම් වෛද්‍ය හේතූන් මත තම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා විශ්‍රාම ගන්වනු ඇත.

**05.** විවාහක තත්වය :- අයදුම්කරුවන් විවාහක අය වියයුතුය.
අවම වශයෙන් විවාහ වී වසර 5ක් වත් ගතවී තිබිය යුතුය.
වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.
(විවාහ රෙජිස්ට්‍රාර්ධූරයකට අයදුම්කරන්නන් සඳහා පමණක් අදාළ වේ.)

**06.** අධ්‍යාපන සුදුසුකම් :-

**i. උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්වරුන්**

අ. **මූලික සුදුසුකම්**

කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙල) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සැ.යු. - අ.පො.ස. (සා.පෙල) හෝ ඊ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතුය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතුය.

**ii. උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්**

අ. **මූලික සුදුසුකම්**

කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව (තනතුරට අදාල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් සමඟ අ.පො.ස. (සා.පෙල) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සැ.යු. - අ.පො.ස. (සා.පෙල) හෝ ඊ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතුය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතුය.

ආ. අයදුම්කරුවන් ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් ඇත්තෙකු හෝ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු හෝ හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරයෙකු හෝ විය යුතුය.

**iii. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන්**

අ. **මූලික සුදුසුකම්**

කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව (තනතුරට අදාල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් සමඟ අ.පො.ස. (සා.පෙල) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් වත් සමත්ව සිටීම.

ආ. සිංහල/දෙමළ දැනීම සමඟ මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සටහන :- මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවුවහොත් නියමිත මට්ටමට අඩු අධ්‍යාපන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් ගැන සලකා බැලිය හැකි වේ.

**07. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම**

**I. අත් අකුරු පරීක්ෂාව :-**

තනතුරට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් මෙම ලකුණු 25න් ලකුණු 15ක් වත් ලබා තිබිය යුතුය. අත් අකුරු පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන්ට වචන 100 කට නොඅඩු ඡේදයක් කියවන විට ලිවීමට සැලැස්විය යුතුය. මෙහි දී අක්ෂර වින්‍යාසය හා අත් අකුරු වල නිවැරදි බව, පැහැදිලි බව, පහසුවෙන් කියවිය හැකි වීම සැලකිල්ලට ගත යුතුවේ.

**II. පැහැදිලිව කියවීමේ හැකියාව :-**

වේගවත්ව හෝ හෙමින් නොව අර්ථවත්ව හා පැහැදිලිව කියවීම.

**III. චරිතය :-**

අයදුම්කරුවන් යහපත් චරිතයක් ඇති අය විය යුතු අතර, එය සනාථ කිරීමට පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන චරිතය හා පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්. 04 සහතිකය), ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිගෙන් ලබා ගන්නා ලද වාර්තාව සහ සුදුසු රහස්‍ය වාර්තා අදාළ කරගත හැක.

**IV. සමාජ තත්ත්වය, ජනප්‍රසාදය :-**

අයදුම්කරුවන් ප්‍රදේශවාසීන්ගේ සුභසාධනය සඳහා දේශපාලන නොවන ස්වේච්ඡා සංවිධාන කෙරෙහි දැක්වූ සහභාගිත්වය, දැරූ තනතුරු සහ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැක්වූ සහභාගිත්වය පිළිබඳ ප්‍රශංසනාත්මක ලිපි ආදිය හා වැදගත් පවුල් පසුබිම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**V. පෞරුෂය :-**

අයදුම්කරු මනා පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.
ශාරීරිකව හා මානසිකව ආබාධිත තත්ත්වයේ පසු නොවිය යුතුය. සුහද බව, ප්‍රසන්න බව, ආචාරශීලීව කථා කිරීමේ හැකියාව, පිළිවෙල කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**VI. ආදායම් තත්වය :-**

ඉල්ලුම්කරු ණය බරින් නිදහස් වීම හා ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ මාසික ආදායම සහ ඔහුගේ දේපළ, ඉඩකඩම් වලින් ලබන ආදායම් ඉල්ලුම්කරුගේ ආදායම් තත්ත්වය සඳහා ලකුණු ලබා දීමේදී සැලකිල්ලට ගැනීම සුදුසුය.

**VII. කාර්යාලීය ස්ථානය :-**

i. කොට්ඨාශයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් යා හැකි කොට්ඨාශයේ මධ්‍ය ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතුය.

ii. වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරයට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහලේ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01 ක් පමණ දුරින් කොට්ඨාශය තුල පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

VIII. අමතර භාෂා දැනුම:-

පුරප්පාඩු තනතුරට අදාළ භාෂා (සිංහල/ දෙමළ) මාධ්‍යය නොවන දෙවන භාෂා දැනුම සඳහා ලකුණු ලබා දීමට අ.පො.ස.(සා.පෙ.) සාමාර්ථය ලබා තිබීම සැලකිය යුතුය.

ඉංග්‍රීසි භාෂාව සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ

**08. ඉල්ලුම් කිරීමට නුසුදුසු අය :-**

I. පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන වශයෙන් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක හෝ පත්වීම් ලබා ඇති අය. (පෞද්ගලික හෝ රජයේ වැටුප් ලබන ස්ථිර රැකියාවක සිටින අයෙකු ඉල්ලුම් කරන්නේ නම් මෙම තනතුර භාරගන්නා අවස්ථාවේ දී රැකියාවෙන් ඉවත් වී සිටිය යුතුය.)

II. අධිකරණයකින් වරදකරුවකු බවට පත් වූ අය හෝ මේ වන විට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවක විත්තිකරුවකු වී ඇති හෝ නඩු පැවරීමකට අදාළව මේ වන විට අධිකරණය/ පොලිසිය හෝ එවැනි ආයතනයක් මඟින් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින හෝ අය.

III. නීතිඥ හා නොතාරිස් වැනි වෘත්තීන්හි යෙදී සිටින අය

IV. මාසික දීමනාවක් ලබන මහජන නියෝජිතයින් (පාර්ලිමේන්තු/ පළාත් සභා/ මහනගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වැනි අය)

V. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වනු ලැබූ රජයේ සේවකයින් ( ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 7:1 වගන්තිය)

**09. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම :-**

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකිරීමෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඇබෑර්තුව පවතින කොට්ඨාශය ඇතුලත ප්‍රසිද්ධ ස්ථානවල දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඇබෑර්තුව පවතින බවට දැන්වීම් මඟින්ද ප්‍රසිද්ධ කරනු ලැබේ. අදාළ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අයදුම්පත්‍ර ලබා ගත හැකිය. එක් අයදුම්කරුවකුට එක් අයදුම්පතක් පමණක් නිකුත් කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති ඉල්ලුම්පත්‍ර දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ බව දන්වා යවනු ලැබේ.

**10. බඳවා ගැනීමේ ක්‍රමය :-**

I. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පිළිබඳව අදාල කොට්ඨාශයේ ප්‍රදේශීය ලේකම් විසින් පෞද්ගලිකව හෝ රහසිගතව සුදුසුකම් පිළිබඳව විමසා බැලීමක් කරනු ඇත. කාර්යාලය පවතින ස්ථානය, ප්‍රදේශවාසීන්ගේ පිළිගැනීම ආදි කරුණු මෙහි සොයා බැලීමට ඇතුලත් වේ.

II. එකී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුවක් අදාළ කොට්ඨාශ ඇතුළත මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතුව, පත්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේ දී අයදුම්කරුවන් විසින් අදාළ සහතික වල මුල් පිටපත්/ සහතික පිටපත් හා ඒවායේ ඡායා පිටපත බැගින් ඉදිරිපත් කළ යුතුය.

IV. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මඟින් ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ පසු, ගරු ඇමතිතුමාගේ අනුමැතිය මත රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සුදුසු පුද්ගලයින් අදාල තනතුරුවලට පත්කරනු ලැබේ.

## විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ අත්පොත - 2018

**18.** තෝරා ගැනීමේ ක්‍රමය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ක්‍රමයක් මගින් වඩාත් සුදුසු අයදුම්කරු තෝරා ගනු ලැබේ.

**(01)** සම්මුඛ පරීක්ෂණය :-

සාමාජිකයින් 03 දෙනෙකුට නොඅඩු පහත සඳහන් අයගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන් පරීක්ෂාවට ලක් කෙරේ.

1. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ අතිරේක දිස්ත්‍රික් ලේකම් (සභාපති)
2. පුරප්පාඩුව පවතින දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (සාමාජික)
3. දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරන ලද දිස්ත්‍රික්කයේ වෙනත් කාර්යාලයක මාණ්ඩලික නිලධාරියෙක් (සාමාජික)

**(02)** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් අයදුම්කරුවන් පිළිබඳව පහත සඳහන් කරුණු පරීක්ෂාවට ලක් කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් පරිදි ලකුණු දීම කළ යුතුය.

(අ) අධ්‍යාපන සුදුසුකම්, ලේඛන තබන භාෂාව හා රාජ්‍ය භාෂාව පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක් කළ යුතුය.

(ආ) අත් අකුරු පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන්ට වචන 100 කට නොඅඩු ඡේදයක් කියවන විට ලිවීමට සැලැස්විය යුතුය. මෙහි දී අක්ෂර වින්‍යාසය හා අත් අකුරු වල නිවැරදි බව, පැහැදිලි බව, පහසුවෙන් කියවිය හැකි වීම සැලකිල්ලට ගත යුතුවේ.

(ඇ) පැහැදිලිව කියවීමේ හැකියාව

වේගවත්ව හෝ හෙමින් නොව අර්ථවත්ව හා පැහැදිලිව කියවීමේ හැකියාව.

(ඈ) ඉල්ලුම්කරුවන්ගේ චරිතය

ග්‍රාම නිළධාරි විසින් නිකුත් කරනු ලබන චරිතය හා පදිංචිය පිළිබඳ සහතිකය, පොලිස් වාර්තාව

(ඉ) සමාජ තත්ත්වය, ජනප්‍රසාදය

සමිති සමාගම් වල දරණ ලද තනතුරු, තනතුරු දරන්නේ නම් ඒ පිළිබඳ සහතික, වැදගත් පවුල් පසුබිම

(ඊ) පෞරුෂය

අයදුම්කරු මනා පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය. ශාරීරිකව හා මානසිකව ආබාධිත තත්ත්වයේ පසු නොවිය යුතුය. සුහද බව, ප්‍රසන්න බව, ආචාරශීලීව කථා කිරීමේ හැකියාව, පිළිවෙල

(උ) ආදායම් තත්ත්වය

අයදුම්කරු ණය බරින් නිදහස් වීම හා අයදුම්කරුගේ/කලත්‍රයාගේ මාසික ආදායම සහ ඔහුගේ දේපල, ඉඩකඩම් වලින් ලබන ආදායම්.

(ඌ) යෝජිත කාර්යාලය පවත්වන ස්ථානය

කොට්ඨාශයේ සියලු දෙනාට හෝ වැඩි දෙනෙකුට හෝ පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාශයේ මධ්‍ය ස්ථානයක පිහිටි හා තනතුරේ තත්ත්වයට ගැලපෙන සුදුසු ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ඇති හැකියාව

(එ) අමතර භාෂා දැනුම

පුරප්පාඩු තනතුරට අදාළ භාෂා (සිංහල/ දෙමළ) මාධ්‍යය නොවන දෙවන භාෂා දැනුම සඳහා ලකුණු ලබා දීමට අ.පො.ස.(සා.පෙ.) සාමාර්ථය ලබා තිබීම. ඉංග්‍රීසි භාෂාව සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

**(03)** ලකුණු දීමේ ක්‍රමය :-

**(අ)** අධ්‍යාපන සුදුසුකම්

- රෙජිස්ට්‍රාර්වරුන් කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාල භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙල) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.
- මූලික අධ්‍යාපන සුදුසුකම වන අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

| | | |
|---|---|---|
| **(ආ)** | අත් අකුරු සඳහා<br>(තනතුරට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් මෙම ලකුණු 25න් ලකුණු 15ක් වත් ලබා තිබිය යුතුය.) | 25 |
| **(ඇ)** | පැහැදිලිව කියවීමේ හැකියාව | 10 |
| **(ඈ)** | චරිතය | 10 |
| **(ඉ)** | සමාජ තත්ත්වය/ ජනප්‍රසාදය | 10 |
| **(ඊ)** | පෞරුෂය | 15 |
| **(උ)** | ආදායම් තත්ත්වය | 10 |
| **(ඌ)** | යෝජිත කාර්යාලය පවත්වන ස්ථානය | 10 |
| **(ඍ)** | අමතර භාෂා දැනුම | 10 |
| | | **100** |

❖ **තනතුරට සුදුසුකම් ලැබීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී අවම වශයෙන් ලකුණු 50 ක් ලබා තිබිය යුතු වේ.**

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## අයදුම්පත් කැඳවීමේ දැන්වීම

.......................................... දිස්ත්‍රික්කයේ ........................................ කොට්ඨාශයේ

උප්පැන්න සහ මරණ හා ............................................................... කොට්ඨාශයේ

විවාහ / අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය

සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය

ඉහත සඳහන් ධූරය සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත නියමිත ලි.ප.බී 75 ආකෘතියෙහි (තම අත් අකුරින්) පුරවා එවිය යුතුය. නියමිත ආකෘතිපත්‍ර මෙම කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත හැක.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) /අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වර්ෂ 20............ක් වූ..................................... මස ................වෙනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන්නට, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

i. <u>අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය</u>. "ශ්‍රී ලාංකික" යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකාවේ පුරවැසියෙක් වීමය.

ii. <u>පදිංචිය</u> - ............................................................ උප්පැන්න, මරණ කොට්ඨාශයට හා ............................................................................ විවාහ/ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) කොට්ඨාශයට ඇතුළත් ඇමුණුමේ සඳහන් ගම/ ග්‍රාම නිලධාරි වසම තුළ තමාටම හිමි නිවාස ඇති සහ ස්ථිර පදිංචියක් ඇත්තා වූ, එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන සැහෙන දේපලක් අයිතිව ගම්වාසීන්ගේ සැලකුම් ලබන අය විය යුතුයි.

iii. <u>වයස</u> - අවුරුදු 45ත් 62ත් අතර විය යුතුයි. (විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වේ)

iv. <u>විවාහක තත්වය</u> - අයදුම්කරුවන් විවාහක අය විය යුතුය.
අවම වශයෙන් විවාහ වී වසර 5ක් වත් ගතවී තිබිය යුතුය.
වැන්දඹු හෝ දික්කසාද අය නොවිය යුතුය.
(විවාහ රෙජිස්ට්‍රාර් ධූරයකට අයදුම්කරන්නන් සඳහා පමණක් අදාළ වේ.)

v. <u>අධ්‍යාපන සුදුසුකම්</u> - අ) උප්පැන්න, මරණ සහ විවාහ/ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය සඳහා මූලික සුදුසුකම්

කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවන භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍යය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සැ.යු - අ.පො.ස (සා.පෙ) හෝ ඒ හා සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් වශයෙන් සැළකිය යුතුය. එම විෂය කොටස් දෙකම සමත්නම් පමණක් විෂය සමත් ලෙස සැළකිය යුතුය.

ආ) උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය සඳහා මූලික සුදුසුකම්

කොට්ඨාශයේ ජනතාවගේ භාෂා අවශ්‍යතාවය අනුව දෙවන භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව(තනතුරට අදාළ භාෂා මාධ්‍යය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස (සා.පෙ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සැ.යු - අ.පො.ස (සා.පෙ) හෝ ඒ හා සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් වශයෙන් සැළකිය යුතුය. එම විෂය කොටස් දෙකම සමත්නම් පමණක් විෂය සමත් ලෙස සැළකිය යුතුය.

- උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය සඳහා වෘත්තීය සුදුසුකම්

අයදුම්කරුවන් ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකයක් ඇත්තෙකු හෝ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු හෝ හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරයෙකු හෝ විය යුතුය.

vi. <u>චරිතය</u> - අයදුම්කරු යහපත් චරිතයක් ඇති අයෙකු වියයුතු අතර, එය සනාථ කිරීමට පදිංචි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන චරිතය හා පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්. 04 සහතිකය) හා ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිගෙන් ලබා ගන්නා ලද පොලිස් වාර්තාවේ පිටපතක් බැගින් අයදුම් පත්‍රයට ඇමිණිය යුතුය.

vii. <u>සමාජ තත්ත්වය, ජනප්‍රසාදය</u> - අයදුම්කරු ප්‍රදේශවාසීන්ගේ සුභසාධනය සඳහා දේශපාලන නොවන ස්වෙච්ඡා සංවිධාන කෙරෙහි දැක්වූ සහභාගිත්වය, දැරූ තනතුරු සහ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැක්වූ සහභාගිත්වය පිළිබඳ ප්‍රශංසනාත්මක ලිපි ආදිය වෙතොත් ඒවායේ පිටපත් ඉදිරිපත් කිරීම වඩාත් සුදුසු ය.

viii. <u>පෞරුෂය</u> - අයදුම්කරු මනා පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.
ශාරීරිකව හා මානසිකව ආබාධිත තත්ත්වයේ පසු නොවිය යුතුය. සුහද බව, ප්‍රසන්න බව, ආචාරශීලීව කථා කිරීමේ හැකියාව, පිළිවෙල කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ix. <u>ආදායම් තත්වය</u> - අයදුම්කරු/කලත්‍රයා ණය බරින් නිදහස් වීම හා අයදුම්කරුගේ/ කලත්‍රයාගේ මාසික ආදායම සහ දේපළ, ඉඩකඩම්වලින් ලබන ආදායම් අයදුම්කරුගේ ආදායම් තත්ත්වය සඳහා ලකුණු ලබා දීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

x. <u>කාර්යාලයීය ස්ථානය</u> - කොට්ඨාශයේ සියලු දෙනාට හෝ වැඩි දෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාශයේ මධ්‍ය ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට අයදුම්කරුට හැකිවිය යුතුය.

වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරයට බඳවා ගැනීමේ දී අයදුම්කරුට රජයේ රෝහලේ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාශය තුල පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

04 . ඉල්ලුම් කිරීමට නුසුදුසු අය -

- පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන වශයෙන් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක හෝ පත්වීම් ලබා ඇති අය.
  (පෞද්ගලික හෝ රජයේ වැටුප් ලබන ස්ථිර රැකියාවක සිටින අයෙකු ඉල්ලුම් කරන්නේ නම් මෙම තනතුර භාරගන්නා අවස්ථාවේ දී රැකියාවෙන් ඉවත් වී සිටිය යුතුය.)
- අධිකරණයකින් වරදකරුවකු බවට පත් වූ අය හෝ මේ වන විට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවක විත්තිකරුවකු වී ඇති හෝ නඩු පැවරීමකට අදාළව මේ වන විට අධිකරණය/ පොලිසිය හෝ එවැනි ආයතනයක් මගින් පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින හෝ අය.
- නීතිඥ හා නොතාරිස් වැනි වෘත්තීන් වල නියැලී සිටින අය.
- මාසික දීමනාවක් ලබන මහජන නියෝජිතයින් (පාර්ලිමේන්තු / පළාත් සභා/ මහනගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වැනි අය)
- සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වනු ලැබූ රජයේ සේවකයින්
  ( ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 7:1 වගන්තිය)

05. තෝරා ගනු ලබන අයදුම්කරු වෙත පත්වීම ප්‍රදානය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ හා මින්මතු පනවනු ලබන්නා වූ නීති රීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔහු බැඳී සිටීමේ කොන්දේසියට යටත්ව සහ එකොළොස් මසක් ගතවන තෙක් පරීක්ෂණයට භාජනය වන අයුරිනි. මාස දහයක් අවසානයේදී ඔහු රාජකාරියෙහි ස්ථිර කිරීමට සුදුසු යයි කියා වැටහී ගියෙහි නම් , ස්වකීය කාර්යයන් සම්බන්ධ අණපනත් පිළිබඳවත් , දෙපාර්තමේන්තුවේ නීති රීති පිළිබඳවත් තම දැනීම විමසා බැලීම පිණිස පවත්වනු ලබන විභාගයකට පෙනී සිටිය යුතුය. එම විභාගයේදී අවශ්‍ය ප්‍රමාණයට සාමාර්ථය ලැබුවෙහි නම් පරීක්ෂණ කාලය අවසන් වූ විට ඔහු රෙජිස්ට්‍රාර්ධුරයෙහි ස්ථිර කරනු ලැබීමට සුදුසු වේ. එකී කාලය තුළ ඔහු තනතුරට නුසුදුසු බව පෙනී ගියෙහි නම් , නැතහොත් පවත්වන ලද විභාගයෙන් අසමත් වුයෙහි නම් දැන්වීමක් නැතිවම තනතුරෙන් ඉවත් කිරීමට පුළුවන.

06. අයදුම්පතෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමටත් , පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් වහාම සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වනවා ඇත.

.............................................................

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්

20............................ වැනි දින

.............................................................

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

ඇමුණුම 1

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### අයදුම්පත් කැඳවීමේ දැන්වීම

.................................................. දිස්ත්‍රික්කයේ .................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................................................. උප්පැන්න, මරණ හා .................................................. කොට්ඨාශයේ විවාහ / අතිරේක විවාහ

**(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය**

**සිංහල මාධ්‍ය/දෙමළ මාධ්‍ය**

(ඉහත තනතුර සඳහා අයදුම්කරන්නන් පහත ග්‍රාම නිලධාරි වසම්/ ගම තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ අය විය යුතුය.)

| ග්‍රාම නිලධාරි වසම්/ ගම් ලැයිස්තුව | | |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

..................................................................

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්

..................................................................

43-V

| |
|---|
| මෑතකදී ලබාගත් ඔබේ ඡායාරූපයක් මෙහි අලවන්න |

# ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(මෙම අයදුම්පත අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුයි.)

(අයදුම්පතේ අංක 3, 6, 9, 13 හා 14 ට අදාළ සහතික වල ඡායාපිටපත් ඇමිණිය යුතුය.)

රෙ.ප.බී. 75
Registration B 75
(F 2 Sin) 5/71

..........................................................................................................

.......................................... රෙජිස්ට්‍රාර් ධූරය සඳහා අයදුම්පත්‍රය

**1.** අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ..........................................................

**2.** ස්ථිර ලිපිනය :- ..........................................................

..........................................................

**3.** උපන් දිනය :- ........................ **3(1).** ජාතික හැඳුනුම්පත් අංකය :- ........................

**4.** ස්ත්‍රී/ පුරුෂ බව :- ........................

**5.** දුරකථන අංක - නිවස :- ........................

ජංගම :- ........................

**6.** අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල

| අංකය | විෂය | සාමාර්ථය | අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ආ) අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල :-

| අංකය | විෂය | සාමාර්ථය | අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(ඉ) ඔබ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරක් සඳහා අයදුම් කරන්නේ නම් මවුලවි සහතිකය ලබා තිබේද? යන්න :-

..........................................................

9. (අ) විවාහ වූ දිනය :- ..............................

(ආ) කලත්‍රයාගේ නම :- ..........................................................................................

10. (අ) කලත්‍රයා ජීවත්ව සිටීද යන වග :- ..............................

(ආ) කලත්‍රයාගේ රැකියාව (ව්‍යාපාරික නම් ව්‍යාපාරයේ ස්වභාවය) :- ..........................................

..........................................................................................

(ඇ) දරුවන් ගණන :- ..................................................

11. (අ) අයදුම්කරුගේ පියාගේ නම :- ..........................................................................

(ආ) පියාගේ රැකියාව :- ..........................................................................................

(ඇ) ඥාතීන් දෙදෙනෙකුගේ නම් සහ ඔවුන්ගේ රැකියාවන්

1. ..........................................................................

..........................................................................

..........................................................................

2. ..........................................................................

..........................................................................

..........................................................................

12. (අ) කොට්ඨාශය තුළ ස්ථිරව පදිංචිව සිටි කාලය :- ..........................................................................

(ආ) ධුරය සඳහා තෝරාගතහොත් කාර්යාලය පිහිටුවීමට අදහස් කරන ස්ථානයේ ලිපිනය

..........................................................................

..........................................................................

..........................................................................

13. පදිංචිය හා චරිතය පිළිබඳව සහතික පත්‍රය (ඩී එස් 04)

නිකුත් කළ ග්‍රාම නිලධාරිගේ නම ..........................................................................

කොට්ඨාශය ..........................................................................

දූරකථන අංකය ..........................................................................

14. (අ) ඔබ කිසියම් වරදකට අධිකරණයකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවේද? ඔව් / නැත

(ආ) ඔව් නම් වරදේ ස්වභාවය ..........................................................................

..........................................................................................

(පොලිස් වාර්තාවක් මඟින් තොරතුරු සනාථ කළ යුතුය.)

ඉහත සඳහන් තොරතුරු නිවැරදි හා සත්‍ය බව ද, එකී තොරතුරු වලින් කිසියම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව මෙම ධූරයට මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මෙම ධූරය සඳහා වූ මගේ අපේක්ෂකත්වය වහාම අවලංගු වන බව ද, යම් හෙයකින් මෙම පත්වීම මට ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් වහාම පහකරනු ලැබීමට මා යටත් වන බව ද , මම මෙයින් පිළිගනිමි.

දිනය :- ........................................

........................................

අයදුම්කරුගේ අත්සන